# පාසල් ඵලදායිතා වර්ධනය සඳහා ගුරුවරයා සතු කාර්යභාරය කවරාකාර වේදැයි විමසා බැලීමේ අධ්‍යයනයක්.


ටී. ඩබ්. වී. ඉඳිගහවල

අධ්‍යාපනවේදී උපාධි (පළමු පංතිය සාමාර්ථ) - කොළඹ විශ්ව විද්‍යාලය 2002



UCLIB

561476


අධ්‍යාපනපති උපාධියේ අර්ධ අවශ්‍යතා සම්පූර්ණ කිරීම
සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයට ඉදිරිපත් කෙරෙන
ස්වාධීන නිබන්ධනය.2011


561476

# සංක්ෂිප්තය

සමාජයේ සෑම මිනිසකුම සිය ජීවිත කාලය තුළ අනිවාර්ය වශයෙන් සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වන ප්‍රධානතම ආයතනය වන්නේ පාසලයි. ශ්‍රී ලංකාවේ 2006 පාසල් සංගණන වාර්තා අනුව 3,836,550 ක ශිෂ්‍ය ජනගහනයක්ද ඔවුනට අධ්‍යාපනය ලබාදෙන පාසල් 9714 ක් හා 204,908 ක ගුරු පිරිසක් ද වන බව දක්වා ඇත. එමෙන්ම පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ කළමනාකරුවන් විශාල පිරිසක් ඇතුළුව අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවක පිරිසක්ද සේවයෙහි නිරතව සිටී. මෙම විශාල පද්ධතිය සංවර්ධනය හා නඩත්තුව සඳහා රජය වාර්ෂිකව 2%(රුපියල් බිලියන 104.2) කට වැඩි ප්‍රතිශතයක් ජාතික ආදායමෙන් වියදම් කරනු ලබයි. සමාජ අපේක්ෂණය වන්නේද සිය දරුවන් හට විශිෂ්ට පාසල් අධ්‍යාපනයකි. නමුත් එම කාර්‍යය නිසි ආකාරව මෙරට සෑම පාසලකින්ම ඉටුවේද යන්න වර්තමානයේ අභියෝගයට ලක්වී ඇත. ඊට ප්‍රධාන සාධක ලෙස ජනප්‍රිය පාසල්වලට ඇති වී තිබෙන විශාල ඉල්ලුම, ජාත්‍යන්තර පාසල් සංකල්පය වර්ධනය වීම, ග්‍රාමීය පාසල් වැසී යාමේ තර්ජනයට ලක්වීම හා පෞද්ගලික අධ්‍යාපන මාධ්‍ය විශාල වශයෙන් ජනප්‍රිය වීම දැක්විය හැකිය. ඒ අනුව පාසල් වලට යොදවන සම්පත් වලට සාපේක්ෂව ලබා ගන්නා ඵලදායිතාව කවර මට්ටමක වේදැයි විමසීම අවශ්‍ය බව පැහැදිලි විය.

එබැවින් තෝරාගත් පාසල්වල ඵලදායිතා මට්ටම විමසීම, පාසලක් ඵලදායි කිරීම සඳහා පාසල් අධ්‍යාපනයට සෘජුවම දායකවන භූමිකාව වශයෙන් ගුරුවරයා සතු කාර්යය භාරය විමසීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. එහිදී ගුරුවරයා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලීයේ දී දක්වන සාර්ථකත්වය හා පාසල්වල ඵලදායිතා මට්ටම අතර, සම්බන්ධතාව විමසීම, ගුරුවරයාගේ කාල කළමනාකරණය හා ඵලදායිතා මට්ටම අතර, සම්බන්ධතාව අනාවරණය කරගැනීම හා විෂය සමගාමී ක්‍රියාකාරකම්වල නිරතවීමේ ප්‍රමාණය හා ඵලදායිතා මට්ටම අතර සම්බන්ධතාව විමසීම ප්‍රධාන අරමුණු විය.

මෙම අධ්‍යයනය අම්බලන්ගොඩ අධ්‍යාපන කලාපයේ හික්කඩුව අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් 6කට සීමා විය. අධ්‍යයනය සඳහා තෝරා ගත් පාසල්වල විදුහල්පතිවරු හා නියෝජ්‍ය විදුහල්පතිවරු ද එක් පාසලකින් අහඹු ලෙස තෝරා ගත් ගුරුවරු 10 බැගින් 60 ක් සහ සිසුන් 10 බැගින් 60 ක්ද දෙමව්පියන් 5 බැගින් 30ක් ද ලෙස නියැදිය තෝරා ගැනුණි.

පාසල් ඵලදායිතා මට්ටම මිනුම් කිරීමට ලිඛිත නිරීක්ෂණ ෂෙඩියුලයක්ද, ගුරුවරුන් හා විදුහල්පතිවරුන් හා සිසුන් සඳහා ප්‍රශ්නාවලියක් ද නියෝජ්‍ය විදුහල්පතිවරු හා දෙමාපියන් සඳහා සම්මුඛ සාකච්ඡා ආකෘති පත්‍රයක් ද දත්ත හා තොරතුරු රැස්කිරීම සඳහා භාවිත කෙරුණි.

දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය කරගත හැකි වූ කරුණ වූයේ පාසලක ඵලදායිතාව හා පාසල් වර්ගය අතර පැහැදිලි සබඳතාවක් නොමැති බවකි. එහිදී 3 වර්ගයේ පාසල හා 1AB පාසල් සාපේක්ෂව ඉහළ ඵලදායිතා මට්ටමක පැවති පාසල් විය. එනම් පාසලේ විශාල බව හෝ කුඩා බව හෝ අනුව විෂය ධාරා ප්‍රමාණය අනුව ශ්‍රේණි ප්‍රමාණය අනුව පාසලක ඵලදායිතාව තීරණය නොවන බව අනාවරණය විය.

එමෙන්ම ගුරුවරයා ඉගැන්වීම් කායර්යෙහි නිරතවන ආකරය පිළිබඳ තේමා 7ක් ඔස්සේ විමසා බැලූ අතර එහිදි ඵලදායිතා මට්ටම හා ඉගැන්වීමේ කාර්යයෙහි නිරත ආකාරය අතර, පැහැදිලි සම්බන්ධතාවයක් ඇති බව අනාවරණය විය. ගුරුවරුන්ගේ කාල කළමනාකරණය හා ඵලදායිතා මට්ටම අතර, ද සෘජු සම්බන්ධතාවක් දැකිය හැකි වූ අතර, ගුරු නිවාඩු හා ඵලදායිතා මට්ටම අතර, පැහැදිලි සෘන සහසම්බන්ධතාවක් විය . විෂය සමගාමී කටයුතු වල ගුරුවරුන් සම්බන්ධ වීම හා ඒ ඒ පාසල් වල ඵලදායිතා මට්ටම අතර, දැඩි සම්බන්ධතාවක් නොවූ අතර, එහිදී අනාවරණය වූයේ විෂය සමගාමී කටයුතුවලට නැඹුරු වීම පාසල් වර්ගය අනුව වෙනස් වී ඇති බවයි.

මෙසේ අනාවරණිත කරුණු අනුව පාසලට සුවිශේෂි මට්ටමේ හා පොදුවේ සියලු මට්ටමේ පාසල්වලට යොදා ගත හැකි යෝජනා ඉදිරිපත් කළ අතර, පසු පර්යේෂණ සඳහා ද යෝජනා සපයන ලදී.